1

# තව්හීද් රිසාලත්

## මආද්




ඊමාන් යන්නෙහි තේරුම විශ්වාසය යන්නයි. හැසිරීම පවතින්නේ විශ්වාස අනුව ය. මුඃමින් වූ අපගේ ජීවිතය පවතිනුයේ චර්යාව හා විශ්වාස අනුව ය. එදිනෙදා ජීවිතයේ අප යම් යම් ක්‍රියා කරන්නේත් තවත් ඒවා වළක්වා ගන්නේත් විශ්වාසය මත පිහිටා ය.

ආහාර ගන්නා නිසා බඩගිනි පහවේ යැයි, අපි විශ්වාස කරමු. ඒ නිසා බඩගිනි වූ විට ආහාර වර්ග මිලට ගෙන හා පිස ගෙන කමු. ජලය පානය කළ විට පිපාසය සංසිඳේ යැයි විශ්වාස කරමු. ඒ නිසා ප්‍රයෝජනවත් පාන වන පලතුරු යුෂ, තේ වතුර, සිසිල් බීම වැනි දියරමය ආහාර වර්ග පානය කොට පිපාසය සංසිඳවා ගනිමු.

ගොවීන් ගැන සලකා බලන්න. බීජ වැපිරීමෙන් ධාන්‍ය ලැබෙන බව ඔවුහු විශ්වාස කරති. එනිසා ගොවියෝ වී වපුරති; පසුව රන්වන් පාට ගොයම් කපා අස්වැන්න ලබා ගනිති.

වෙහෙස මහන්සි වී ඉගෙන විභාගය ලිවීමෙන් එය සමත් විය හැකි ය යන්න අපගේ විශ්වාසයයි. ඒ නිසා විභාගය ලිවීමට පෙර දැඩි උත්සාහයක යෙදී ඉගෙන ගෙන විභාග ලියමු.

කාර්යයන් කිරීමට මෙන් ම කාර්යයන් කිරීමෙන් වැළකී සිටීමටත් පදනම් වන්නේ විශ්වාසයයි. ගින්දරට දැවෙයි, යන විශ්වාසය නිසා ගින්න ස්පර්ශ කිරීමෙන් අපි වැළකී සිටිමු. වස පානයෙන් මරණය අත්වේ ය, යන විශ්වාසය නිසා එය පානය කිරීමෙන් වැළකී සිටිමු.

මේ අන්දමින් ම මුස්ලිම් වන අපට විශ්වාස පවතී. ඒවා විශ්වාස කිරීම ඊමාන් යැයි හැඳින්වේ. අප විශ්වාසවන්තයින් හෙවත් මුඃමින්වරු යැයි අමතනු ලබන්නේ ඒ නිසා ය.

**ඊමාන් ආකාර දෙකකි.**

1. ඊමාන් මුජ්මල් (කෙටි විශ්වාසය)
2. ඊමාන් මුෆස්සල් (දීර්ඝ විශ්වාසය)

لَاإِلٰهَ إِلاَّ اللّٰه مُحَمَّدٌ رَّسُوْلُ اللّٰه යන කලිමාවේ තේරුම වටහා ගෙන සිතෙන් දැඩි ව විශ්වාස කොට මුවෙන් උච්චාරණය කිරීමෙන් ඉස්ලාමයට පිවිසෙන්නෙමු.

මේ කලිමාවේ තේරුම "නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවකු නො වේ, මුහම්මද් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් " යන්නයි.

මෙසේ විශ්වාස කිරීම ඊමාන් මුජ්මල් (කෙටි විශ්වාසය) නමින් හැඳින් වේ. දෙවන වර්ගයේ ඊමාන්හි අංශ හයක් අඩංගු ය.

آمَنْتُ بِاللّٰهِ وَمَلاَئِكَتِهِ وَكُتُبِهِ وَرُسُلِهِ وَالْيَوْمِ الْآخِرِ
وَالْقَدْرِ خَيْرِهِ وَشَرِّهِ مِنَ اللّٰهِ تَعَالَى

"මම අල්ලාහ් ගැන ද, ඔහුගේ මලාඉකාවරුන් ගැන ද, ඔහුගේ ආගම් ගැන ද, ඔහුගේ දූතයන් ගැන ද, විශ්වාස කළෙමි. තව ද පරලොව දිනයක් ඇතැයි කියා ද විශ්වාස කළෙමි. තව ද හොඳ නරක සියල්ල සිදුවන්නේ අල්ලාහ්ගේ කැමැත්ත පරිදි (තක්දීර් අනුවය) බව ද විශ්වාස කළෙමි."

මෙසේ විස්තරාත්මක ව විශ්වාස කිරීම "ඊමාන් මුෆස්සල්" (දීර්ඝ විශ්වාසය) නම් වේ. ඉස්ලාමීය විද්වතුන් ඉහත සඳහන් අංග හය කොටස් තුනකට බෙදා ඇත.

එම කොටස් තුන නම්:

1. තව්හීද් - ඒකීයත්වය
2. රිසාලත් - දූත බව
3. මආද් - පරලොව දිවිය හා සම්බන්ධ ඒවා

## 1. තව්හීද්

අල්ලාහ් සහ තක්දීර් සම්බන්ධ විශ්වාසය තව්හීද් (ඒකීයත්වය) යන පළමු කොටසට ඇතුළත් ය. අල්ලාහ් ඒකීය වන්නේ ය. ඔහුට සමාන කිසිවක් නැත. ඔහු සියල්ල දත් අයකි. සර්ව බලධාරියා වූ ඔහුගේ කැමැත්ත පරිදි සියල්ල සිදුවන්නේ ය, යන විශ්වාසය ඇතුළත් කොටස ඒකීයත්වය යැයි හැඳින්වේ.

## 2. රිසාලත්

රිසාලත් (දූත බව) යන කොටසෙහි නබිවරුන්, ආගම්, මලාඉකාවරුන්, පිළිබඳ විශ්වාස අන්තර්ගත ය. මිනිසුන්ට ඍජු මාර්ගයේ ජීවත් වීමට සහ ඍජු මාර්ගය පෙන්වා දීමට අල්ලාහ් විසින් යවනු ලැබූ දූතයෝ නබිවරු ය. මොවුන් අතරින් විශේෂ වූ අය රසූල්වරු යැයි හඳුන්වනු ලබති.

එක් එක් සමාජයන්ට නබිවරු යවනු ලැබූ හ. ඔවුනතරින් තෝරා ගත් පිරිසකට අල්ලාහ් ආගම් ද 'සුහුෆු' ද ලබා දුන්නේ ය. නබිවරුන් අතරින් අවසාන නබිවරයා මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ය. එතුමාට අල්ලාහ් විසින් ලබා දුන් අවසාන ආගම අල් කුර්ආනය වන්නේ ය. අල්ලාහ් නබිවරුන්ට ආගම් හා උපදේශ ලබා දුන්නේ ජිබ්රීල් අලයිහිස්සලාම් නැමැති මලක්වරයා මගිනි. තව ද ඔහුගේ අණ පරිදි ක්‍රියා කරන අපරිමිත සංඛ්‍යාවක් මලාඉකාවරු සිටිති. මෙවැනි විශ්වාස ඇතුළත් කොටස රිසාලත් යනුවෙන් හැඳින් වේ.

## 3. මආද්

මතු දිවිය පිළිබඳ අංග ඇතුළත් කරුණු මආද් යන කොටසට ඇතුළත් ය. මරණයෙන් මතු කබ්රයේ ජීවිතයක් ඇත. මෙලොව ජීවිතය අවසන් වූ විට මතු ජීවිතය ආරම්භ වේ. එහි දී මිනිසුන්ගේ මෙලොව ක්‍රියාකාරකම් ගැන විමසනු ලබන්නේ ය. වැඩියෙන් යහක්‍රියාවල යෙදුණු අයට ස්වර්ගය ද වැඩිපුර පාප ක්‍රියාවල යෙදුණු අයට නිරය ද ලබා දේ.

ඊමානයේ සියලු අංග අප වටහා ගෙන විශ්වාස කළ යුතු ය. එසේ විශ්වාස කිරීම "ඊමාන් ඉක්තියාරි" නම් වේ. මෙවැනි ඊමාන් අපගේ ජීවය පොළඹවන ශක්තිය ලබා දෙයි. මුඃමින්වරුන් වන අප ඊමාන් කෙරෙහි දැඩි ව බැඳෙන විට අප අතර ධෛර්යය, වීරත්වය, උත්සාහය, කැපවීම, දැඩි ව වෙහෙස වීම වැනි ගුණාංග ඇති වේ. කම්මැලිකම, බියගුළු කම, ආත්මාර්ථය, වැනි ගුණාංග නැති වන්නේ ය.

අප ද ඒ අයුරින් ඊමාන් කොට සක්‍රීය හා ඉස්ලාමීය හැඟීම් ඇති අය ලෙස ජීවත් වෙමු. පරලොව ජයගෙන ස්වර්ගය හිමි කර ගනිමු.

ඊමාන් අංග අවබෝධයෙන් විශ්වාස කරමු. ඊමාන් පරම්පරාවෙන් ලැබෙන්නක් නො වේ. බුද්ධියෙන් ලැබෙන්නක් ද නො වේ. එය අල්ලාහ් හා නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් අල් කුර්ආනය හා සුන්නාවේ පහදන ආකාරයට විය යුතු යි.

## අභ්‍යාසය

හරි වැරදි කියන්න.

1. ඊමාන් යන්නෙහි තේරුම විශ්වාසය යන්නයි. ( )
2. ඊමාන් මුජ්මල් යනු විස්තරාත්මක ව ඊමාන් කිරීමයි. ( )
3. ආගම් පිළිබඳ විශ්වාසය තව්හීද් යන කොටසට අයත් වේ. ( )
4. අවසාන නබිවරයා නබි මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් ය. ( )

කෙටි උත්තර සපයන්න

1. විශ්වාසය හේතුවෙන් වළක්වා ගන්නා ක්‍රියා දෙකක් සඳහන් කරන්න.
2. ඊමාන් මුෆස්සල් යන්නෙහි තේරුම කුමක් ද?
3. ඉලාහ් යන්නෙහි තේරුම කුමක් ද?
4. මලාඉකාවරු පිළිබඳ විශ්වාසය ඊමානයේ කුමන කොටසේ අඩංගු ද ?
5. ඊමාන් ඉක්තියාරි මගින් මුඃමින් තුළ ඇතිවන ගුණාංග තුනක් සඳහන් කරන්න.